M 555

# රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

කේ.ඒ.ඩී. තිමල් ප්‍රේමසිරි (2010/Mphil/S/09)

ශාස්ත්‍රවේදී උපාධි - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමා උපාධි - කොළඹ විශ්ව විද්‍යාලය

අධ්‍යාපනපති උපාධි - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

University of Colombo Library Sri Lanka

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතා පූරණය සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධයකි 2013

UCLIB
567835

# සංක්ෂිප්තය

මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව රජයේ පාසල්වල ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය සඳහා බලපාන සාධකය. රැකියා තෘප්තිය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇතත් මෙහි සාමාන්‍ය අර්ථය වන්නේ කිසියම් කෙනෙකු තමා කරන රැකියාවෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ මොනවා ද. සහ තම රැකියාව තුළින් තමාට සත්‍ය වශයෙන් ලැබෙන්නේ මොනවා ද. යන්නෙහි වෙනසයි. රැකියා තෘප්තිය පිළිබඳ කරන ලද විවිධ පර්යේෂණවලින් අනාවරණය වී ඇත්තේ කිසියම් පුද්ගලයෙකුගේ රැකියා තෘප්තියෙහි ස්වභාවය ඔහු සේවය කරන ආයතනයේ කාර්යක්ෂමතාවට හා ඵලදායීතාවට බෙහෙවින් බලපාන බවය.

ගුරුවරුන්ගේ රැකියා තෘප්තියෙහි ස්වභාවය හා එයට බලපාන සාධක විමර්ශනය කිරීම පාසලටත්, අධ්‍යාපන ක්ෂේත්‍රයටත් ඉතා වැදගත්වේ. කවර රටක හෝ අධ්‍යාපන ගමන් මගෙහි නියමුවා වන්නේ ගුරුවරයා ය. විවිධ භූමිකා නිරූපනය කරමින් දරුවන්ගේ ඥාණය සෑදීමට වෙර දරණ ගුරුවරයාට එම සංකීර්ණ කාර්යභාරය මනාව හැසිරවීමට රැකියාවෙන් ලැබෙන්නාවූ තෘප්තියේ ස්වභාවය දැඩි බලපෑමක් සිදුකරනු ඇත. එබැවින් ගුරුවරුන්ගේ රැකියා තෘප්තියෙහි ස්වභාවය විමර්ශනය කරන මෙම පර්යේෂණය අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉතාම වැදගත් වනු ඇත.

පර්යේෂණය ප්‍රධාන අරමුණු හතරක් මත ගොඩ නගන ලදි. එනම් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය කෙරෙහි මානව සම්බන්ධතා ජාලය බලපාන ආකාරය, ගුරු තෘප්තිය කෙරෙහි වැටුප හා අනෙකුත් ප්‍රතිලාභවල බලපෑම, සාමාජීය වශයෙන් ගුරුවරයකුට ඇති පිළිගැනීමේ ස්වභාවය හා ගුරුවරුන්ගේ රැකියා තෘප්තියට උපරිම හා අවම වශයෙන් බලපාන හේතු සාධක අනාවරණය කර ගැනීම මෙහි දී සිදු විය.

එම අරමුණු ඉටු කර ගැනීම සඳහා පර්යේෂණයේ පළමු පරිච්ඡේදය මගින් රැකියා තෘප්ති සංකල්පය නිර්වචනය කිරීම හා අධ්‍යයන ගැටලුවේ පසුබිම විස්තර කර කෙරිණි. දෙවන පරිච්ඡේදයෙන් අදාළ සාහිත්‍ය විමර්ශනයේ න්‍යාය හා රැකියා තෘප්තියට බලපාන සාධක පිළිබඳ කොටස් දෙකකින් සාකච්ඡා කෙරිණි. තුන්වන පරිච්ඡේදයෙන් පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණ ක්‍රමය හා අරමුණු, නියැදිය, දත්ත රැස්කිරීමේ උපකරණ, දත්ත රැස් කළ ආකාරය, පර්යේෂණ සීමා හා නියාමන පරීක්ෂණය ආදිය දක්වන ලදි. සිව්වන පරිච්ඡේදයෙන් දත්ත විශ්ලේෂණය කළ අතර මෙහි දී පුත්තලම හා කුරුණෑගල යන

දිස්ත්‍රික්කවලින් තෝරා ගන්නා ලද රජයේ පාසල් 25ක් ඇසුරින් ගුරුවරු 320කින් යුත් නියැදියකින් රැකියා තෘප්තියේ ස්වභාවය හා ඒ සඳහා බලපාන සාධක විමසා බලන ලදි. එම පාසල්වල විදුහල්පතිවරුන්ගෙන්, ගුරුවරුන්ගෙන් හා අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ගෙන් ප්‍රශ්නාවලියක් මගින් හා සම්මුඛ සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු ඇසුරෙන් රැකියා තෘප්තියට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය කරන ලදි. මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක ක්‍රමයට දත්ත විශ්ලේෂණය කළ අතර ඒ සඳහා ප්‍රතිශත, වගු හා ප්‍රස්තාර යන ක්‍රම භාවිතා කරන ලදි. පස්වන පරිච්ඡේදයෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කෙරිණි. එසේම එම නිගමනවලින් ගුරුවරුන්ගේ රැකියා තෘප්තියේ ස්වභාවය හා එයට බලපා ඇති සාධක මොනවා ද යන්න හඳුනා ගන්නා ලදි.

සමස්තයක් ලෙස ගුරුවරුන්ගෙන් සියයට 80ක් ගුරුවරයකු වශයෙන් සේවය කිරීමට ලැබීම ගැන ඉහළ තෘප්තියකින් සිටින බව අනාවරණය විය. එහෙත් රැකියා තෘප්තියට බලපාන සාධක අනුව රැකියා තෘප්තියට හා අතෘප්තියට විවිධ හේතු සාධක ඇති බව පැහැදිලි විය. ඒ අනුව ගුරුවරුන්ගේ උපරිම රැකියා තෘප්තියට විදුහල්පති භූමිකාව, සහෝදර ගුරු මණ්ඩලයේ භූමිකාව, විශ්‍රාම වැටුපක් ලැබීම, ඉගැන්වීම් කාර්යය පැය හයකට සීමාවීම, දීර්ඝ නිවාඩුවක් ලැබීම, දෙමාපියන්ගේ සහයෝගය, ගුරුවරයකු වශයෙන් සමාජයේ ඇති පිළිගැනීම යන සාධක බලපෑ අතර රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා අතෘප්තියට මාසික වැටුප, වැටුප් වර්ධක හා හිඟ වැටුප්, අධ්‍යක්ෂකගේ භූමිකාව, ලිපිකරුවන්ගේ භූමිකාව, සමස්ත අධ්‍යාපන කාර්යාලයේ සේවාව, සේවස්ථ පැසිවල ගුණාත්මකබව හා සේවස්ථ සැසි නිවාඩු දිනවල පැවැත්වීම දුෂ්කර දීමනාවේ නිර්ණායකයන්, උපකාරක පන්ති පැවැත්වීම, ශිෂ්‍යයින් ඉගෙනීමට ඇති උනන්දුව අඩුවීම හා පාසලේ භෞතික සම්පත් කෙරෙහි දක්වන ගෞරවය අඩුවීම,පන්තියක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව යන සාධක හඳුනා ගැනීමට හැකිවිය. එබැවින් ඉහළ අධ්‍යාපන බලධාරීන් ගුරුවරුන් උපරිම තෘප්තියක් පල කළ සාධක තවදුරටත් රඳවා ගැනීමටත්, අවම තෘප්තියක් පල කළ සාධක ඉහළ නැංවීමටත්, සිත් ගන්නා සුදුසු ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීම මෙම පර්යේෂණයේ අග්‍ර ඵලය ලෙස හැඳින්විය හැකිය.

# Abstract

The main Objective of this research is to find out the causes for or against goverment teacher´s job satisfaction.

Although there are different definitions on job satisfaction, the general consenus is, the diferance between what some one expects to gain from his/her job with what exactly one gets though his/her job. A variety of researches on job satisfaction have revealed that the level of job satisfaction of a person mostly affects the efficiency and the productivity of the body in which he works.

Therefore, it is important to observe the job satisfaction level of the teachers and the factors causing it in school education system. The teacher is the guider of the path of education in any country. The teacher who strives to develop achievemantsfrom of children by playing different roles is affected with the satisfaction level he /she receives from their job Hence, this research that observes the job satisfaction level of the teachers is very important for the educational field.

This research has been developed on four main objectives. They are; the way of affecting the human relationship net towards the teacher job satisfaction, the effect of salary and the other benefits on teacher satisfaction, social acceptance for the teacher and figuring out the factors that cause less or more for teacher job satisfaction.

Accordingly, to achieve those objectives, the first chapter illustrates definition on the concept of job satisfaction and the background of the research. The second chapter under two sections discusses the relevant theory of literary investigation and the facts for job satisfaction. The third chapter explains the

methodology and methodsof the research. The fourth chapter inquires the data analysis as well as the level of the job satisfaction and the causes affecting, from a sample of 320 teachers out of 25 selected government schools in Puttalam and Kurunegala districts. The factors for job satisfaction have been further studied with the information gained via a questionnaire and the interviews with the school principals, teachers and directors of education. Moreover, this research has analysed data on quantitative method including percentages, tables and graphs, Conclusions and proposals have been produced in the fifth chapter. The level of the teachers, job satisfaction and the factors caused are presentedon through the conclusions.

As a whole, it is revealed that 80% of teacher are with a high satisfaction serving as a teacher. But, accordance with the causes for job satisfaction, it has been clear that, there are factors for job satisfaction and dissatisfaction. According to that the role of the principal, the role of the teacher staff, pensiov, limiting the teaching process for six hours, long vacation, parents co-operation, social acceptance as a teacher have been affected as factots for maximum job satisfaction of teachers, Meanwhile, monthly salary, salary increment and salary shortage, the role of the director, the role of clerks, the whole service of the education office, the quality of the seminars also conducting them on holidays, criteria on diatance allowances, conducting supportive classes, lack of interest of students for learning, lack of respect for physical resources, the number of students of a class could be recognized as the factors for job dissatisfaction of government school teachers. Therefore, arranging a proper interesting process by the high rank officers of education to further mainting the causes shown a maximum satisfaction by the teachers and in order to enhance the causes shown minimum satisfaction, is the most expected outcome of this research.